මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## පෙර'ඔරට සවියක් ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

| කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය | 11 ශ්‍රේණිය | කාලය : පැය 01 යි |
|---|---|---|

### I කොටස

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ ගැළපෙන අංකයට (×) ලකුණ යොදන්න.

01. ''මඩ සෝදාගත් කළ හෙළ ගොවියා රජකමට පවා සුදුසුය'' යන ප්‍රකාශය කර ඇත්තේ,
(1) මහා පරාක්‍රමබාහු රජතුමාය. (2) රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාර තුමාය.
(3) රොබට් නොක්ස් මහතා ය. (4) දෙවන අග්බෝ රජතුමාය.

02. 1960 දශකයේ ආරම්භ කළ හරිත විප්ලවය නිසා රසායනික පොහොර හා කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් විශාල ගැටළු රාශියකට ලංකාවට මුහුණ පෑමට සිදුව ඇත. එයින් මිදීම සඳහා වර්තමානයේ ගෙන ඇති නව සංකල්ප වන්නේ,
(1) ගමයි පන්සලයි, වැවයි දාගැබයි සංකල්පය
(2) අපි වවමු රට නගමු සංකල්පය
(3) ගම වවා රට නගමු සංකල්පය
(4) හරිත කෘෂිකර්මාන්ත සංකල්පය

03. දළ දේශීය නිෂ්පාදනයට කෘෂිකර්මයේ දායකත්වය වර්තමානයේ අඩුවෙමින් පවතී. එයට හේතුවන කරුණු කිහිපයක් පහත දක්වා ඇත.
A- කෘෂිකාර්මික භූමිවල පරිභෝජනය අඩු වීම.
B - කෘෂිකර්මයේ අභිමානවත් බව අඩු වීම.
C - තරුණයින් කෘෂිකර්මාන්තයෙන් ඈත්වීම.
D - ජනගහන වර්ධනය වේගවත් වීම.
ඉහත ප්‍රකාශවලින් සත්‍ය වනුයේ,
(1) ABC ය. (2) ABD ය. (3) BCD ය. (4) ඉහත සියල්ලමය.

04. බෝග වගාවේදී සූර්යාලෝකය විවිධ ආකාරයෙන් බලපෑම් කරයි. සූර්ය විකිරණමානය හා සූර්ය දීප්තමානය යන උපකරණ මගින් මනිනු ලබන්නේ පිළිවෙළින් සූර්යාලෝකයේ කුමන තත්ත්ව ද?
(1) ආලෝකයේ ගුණාත්මය හා ආලෝකයේ තීව්‍රතාවය
(2) ආලෝකයේ තීව්‍රතාවය හා ආලෝකය ලැබෙන කාල සීමාව
(3) ආලෝකයේ ගුණාත්මය හා ආලෝකය ලැබෙන කාල සීමාව
(4) ආලෝකය ලැබෙන කාල සීමාව හා ආලෝක තීව්‍රතාවය

05. සුළඟේ වේගය හා සුළඟේ දිශාව දැන ගැනීමට භාවිතා කරන උපකරණ පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) අනිල මානය හා සුළං දිශා දර්ශකය (2) සුළං දිශා දර්ශකය හා අනිලමානය
(3) අනිලමානය හා ආර්ද්‍රතාමානය (4) සූර්ය විකිරණ මානය හා අනිලමානය

06. ඊසාන දිග මෝසම් සුළං මගින් වර්ෂාව ලැබෙන කාල සීමාව ලෙස සලකනු ලබන්නේ,
(1) මැයි - සැප්තැම්බර් දක්වාය. (2) දෙසැම්බර් - පෙබරවාරි දක්වාය.
(3) මාර්තු - අප්‍රේල් දක්වාය. (4) සැප්තැම්බර් - ඔක්තෝම්බර් දක්වාය.

07. වර්ෂාපතනය හා සුළගේ වේගය මනින සම්මත ඒකක වනුයේ,
(1) සෙන්ටිමීටර (cm) - පැයට කිලෝමීටර් ය. ($kmh^{-1}$)
(2) මිලි මීටර් (mm) - පැයට කිලෝමීටර් ය. ($kmh^{-1}$)
(3) ලීටර් (l) - තත්පරයට මීටර් ($ms^{-1}$)
(4) මිලි ලීටර් (ml) - තත්පරයට මීටර් ($ms^{-1}$)

08. අධික උෂ්ණත්වය හා පීඩනය නිසා විපර්යාසවලට භාජනය වූ පාෂාණ විපරිත පාෂාණයි. ඒ සඳහා උදාහරණයකි,
(1) ග්‍රැනයිට් (2) හුණුගල් (3) කිරිගරුඬ (4) තිරුවාණා

09. පාංශු ජලය පිළිබඳව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පාංශු ක්ෂුද්‍ර අවකාශ තුළ රැඳී පවතින්නේ ජලාකර්ෂණ ජලයයි.
(2) ජලාකර්ෂණ ජලය ශාකවලට පහසුවෙන් අවශෝෂණය කළ හැකිය.
(3) පාංශු ක්ෂුද්‍ර අවකාශ තුළ ඇත්තේ කේෂාකර්ෂණ ජලයයි.
(4) කේෂාකර්ෂණ ජලය ශාකවලට පහසුවෙන් අවශෝෂණය නොවේ.

10. තවාන් දමා සිටුවීමට අවශ්‍ය නොවන, බීජ අයත් ශාක කුලය වන්නේ,
(1) ලිලියේසියේ ය. (2) සොලනේසියේය. (3) කෘෂිපරේසියේ ය. (4) කුකර්බිටේසියේය.

11. ඖෂධ, සුවඳ විලවුන් හා සබන් නිෂ්පාදනය සඳහා බෙහෙවින් පාදක කරගනු ලබන බෝග කාණ්ඩයකි,
(1) ධාන්‍ය බෝග (2) තෙල් බෝග (3) කෙඳි බෝග (4) මාෂ බෝග

12. පහත දැක්වෙන බෝග අතරින් එකම කුලයට අයත් බෝග වන්නේ,
A - මිරිස් B - දඹල C - කවුපි D - කරවිල
(1) A හා B ය. (2) B හා C ය. (3) A හා C ය. (4) A හා D ය.

13. බහු කාර්ය බිම් සැකසීමේ උපකරණයක් වන්නේ මින් කුමක් ද?
(1) උදැල්ල (2) තැටි නගුල (3) මුල්ලුව (4) රොටවේටරය

14. ඇලි හා වැටි පිළියෙල කිරීමට භාවිතා කරන උපකරණයකි,
(1) තැටි නගුල (2) රොටවේටරය (3) ජපන් පරිවර්තන නගුල (4) රිජරය

15. බෝග වගාවේදී අතුරුයත් ගැමේ පියවරක් වන්නේ,
(1) පස පෙරළීමය. (2) පැළ අවට පස් බුරුල් කිරීමය.
(3) කැට පොඩි කිරීමය. (4) පාත්ති සැකසීමය.

16. තවාන් තුළ දැඩි කිරීම ලෙස හඳුන්වනුයේ,
(1) පැළයට පොහොර අවශ්‍ය පමණට යෙදීමය.
(2) හොඳින් ජල සම්පාදනය කිරීමය.
(3) තවානෙන් පැළ ගලවා ක්ෂේත්‍රයේ සිටුවීමට සුදුසු තත්ත්වයට ක්‍රමයෙන් හුරු කිරීමය.
(4) තවානට හොඳින් සෙවණ සැපයීමය.

17. තවාන් තැටිවලින් පැළ ගලවා ගැනීමේ පහසුව සඳහා, තැටියේ කුටීරවල පතුලට යෙදිය හැකි ද්‍රව්‍යයකි,
(1) පොලිතින් පටි (2) කොම්පෝස්ට් (3) දහයියා (4) ගඩොල් කැබලි

18. ඩැපොක් තවානක වගා කර ඇති ගොයම් පැළ ක්ෂේත්‍රයේ සිටුවීමට යෝග්‍ය වන්නේ තවාන් දමා,
(1) දින 7 - 10 අතරේදීය. (2) දින 10 - 14 අතරේදීය.
(3) දින 14 - 17 අතරේදී ය. (4) දින 17 - 21 අතරේදීය.

19. වගා බිමකට යොදන ජලය හානි වීම අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග අඩංගු පිළිතුර තෝරන්න.
A - මූලික බිම් සකස් කිරීමේදී ගැඹුරට පස පෙරළීම
B - රසායනික පොහොර නිසි පරිදි භාවිතය
C - කාබනික පොහොර නිසි පරිදි භාවිතය
D - පස මතුපිට වසුන් යෙදීම.
(1) A,B හා C ය. (2) A,B හා D ය. (3) A,C හා D ය. (4) B,C හා D ය.

20. ඇළි ජල සම්පාදන ක්‍රමය පහත කුමන බෝග වගාවන් සඳහා ගැලපේද?
(1) වී , කෙසෙල් (2) සෝයා බෝංචි , මුං
(3) වැටකොළු , පතෝල (4) බඩ ඉරිඟු , මඤ්ඤොක්කා

21. ජල අවශ්‍යතාවය අඩුම ජල සම්පාදන ක්‍රමයක් වන්නේ,
(1) පිටාර ජල සම්පාදනයයි. (2) බිංදු ජල සම්පාදනයයි.
(3) ඉසින ජල සම්පාදනයයි. (4) භූගත ජල සම්පාදනයයි.

22. ගොඩ ක්‍රමයට කොම්පෝස්ට් සැකසීමේදී කාබනික ද්‍රව්‍ය වියෝජනය වේගවත් කිරීමට ඉවහල් වන ක්‍රියාකාරකමක් වනුයේ,
(1) සති 2 කට වරක් ආවරණය ඉවත් කර ජලයෙන් තෙත් කර ගොඩ පෙරළීමය.
(2) වාතාශ්‍රය ඇතුළු නොවන සේ කාබනික ද්‍රව්‍ය ගොඩ හොඳින් වසා තැබීමය.
(3) දිනපතා ආවරණය ඉවත් කර ජලය යෙදීමය.
(4) කාබනික ද්‍රව්‍ය ලෙස වැඩි ප්‍රමාණයක් පිදුරු එක් කිරීමය.

23. කාබනික දියර පොහොර සෑදීමේදී භාවිතයට ගත හැකි වඩා සුදුසු ශාක පත්‍ර වනුයේ,
(1) කොස් කොළ හා එරබදු කොළ ය.
(2) අඹ කොළ හා ග්ලිරිසිඩියා කොළය.
(3) ග්ලිසිඩියා හා වල් සූරියකාන්ත කොළය.
(4) කොහොඹ කොළ හා ඉපිල් ඉපිල් කොළය.

24. පොහොර භාවිතය කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ගත හැකි ක්‍රියාමාර්ග වන්නේ,
(1) වර්ෂා ජලය නොමැති කාලයේ පොහොර යෙදීම.
(2) වගාවට යොදන පොහොර ප්‍රමාණය පැළ සිටුවීමේදීම යෙදීම.
(3) වර්ෂාව අධික කාලයේ පොහොර යෙදීම.
(4) පස මදක් තෙත්ව ඇති විට පොහොර යොදා පසට කලවම් කිරීම.

25. වල් පැළෑටි හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A මොණරකුඩුම්බිය, කුප්පමේණියා, දියහබරල - පලල් පත්‍ර වල් පැළෑටිය
B බටදැල්ල, මාරුක්, ඇටෝරා - ආක්‍රමණශීලී වල් පැළෑටිය.
C කලාදුරු, බැලතණ, නෙරෙංචි - ඖෂධ සඳහා භාවිතා කරයි.
D නිදිකුම්බා, තුත්තිරි, ගොඩමාරුක් - ජලජ වල් පැළෑටි වේ.
ඉහත ප්‍රකාශවලින් සත්‍ය වන්නේ,
(1) A හා B ය. (2) A හා C ය. (3) A හා D ය. (4) B හා D ය.

26. වාර්ෂික වල් පැළවල විශේෂ ලක්ෂණයක් **නොවන්නේ,**
(1) ජීවිත කාලය වසරකට වඩා අඩු වීම. (2) බීජ ඉතා විශාල සංඛ්‍යාවක් නිපදවීම.
(3) බීජවලින් පමණක් පැළ හට ගැනීම. (4) සමහර අවස්ථාවලදී පත්‍ර හෝ මුල් මගින් පැළ හට ගැනීම.

27. ගෙවත්තේ කෙසෙල් වගාවේ පැළ තුළ පහත දැක්වෙන ලක්ෂණ දක්නට ලැබුණි.
- පැළවල වර්ධනය බාල වී කුරුවීම.
- අළුත් පත්‍ර කහවන් කොළ පැහැයක් ගැනීම.
- පත්‍ර ගොනු ගැසී පත්‍ර සෙව්වන්දියක් ඇති වීම.

මෙම ලක්ෂණ අනුව කෙසෙල් වගාවට වැළඳී ඇත්තේ,
(1) කොල කොඩවීමේ රෝගයයි. (2) කෙසෙල් කඳ ගුල්ලාගේ හානියයි.
(3) පැනමා රෝගයයි. (4) වඳ පීදීමේ රෝගයයි.

28. පටක විද යුෂ උරාබීම මගින් හානි ගෙන දෙන පළිබෝධකයෙකි,
(1) ඉල්මැස්සා (2) පලතුරු මැස්සා (3) කුඩිත්තා (4) පුරුක් පණුවා

29. ගොයම් පැළෑටිය සම්බන්ධ පහත ප්‍රකාශවලින් නිවැරදි පිළිතුරු තෝරන්න.
(1) සෑම වී ප්‍රභේදයකම වර්ධක අවධිය හා ප්‍රජනක අවධිවල දින ගණන සමානය.
(2) සෑම වී ප්‍රභේදයකම ප්‍රජනක අවධිය හා මේරීමේ අවධිවල දින ගණන සමානය.
(3) සෑම වී ප්‍රභේදයකම වර්ධන හා මේරීමේ අවධිවල දින ගණන සමාන ය.
(4) සෑම වී ප්‍රභේදයකම වර්ධක අවධිය ප්‍රජනක අවධිය හා මේරීමේ අවධිවල දින ගණන සමානය.

30. BG සහ BW යන අක්ෂර වී ගොවීන් අතර ප්‍රචලිතය. එම අක්ෂරවලින් හැඳින්වෙන වී පර්යේෂණ ආයතන පිහිටි ස්ථාන පිළිවෙළින්,

(1) බතලගොඩ හා බෝඹුවල ය. (2) මහ ඉළුප්පල්ලම හා බෝඹුවලය.
(3) බණ්ඩාරවෙල හා බටඅත ය. (4) බතලගොඩ හා ගන්නෝරුවය.

31. ඒක බීජ පත්‍රී බීජ වනුයේ,

(1) බඩඉරිඟු, වී, සෝයා, තල (2) බඩඉරිඟු , වී, කුරක්කන් , මෙනේරි
(3) බෝංචි , වී , මිරිස් , බණ්ඩක්කා (4) වී , බඩඉරිඟු, බෝංචි , කුරක්කන්

32. පටක රෝපණ ක්‍රමයට පැළ නිපදවීමේ **අවාසියක්** වනුයේ,

(1) වැඩි ප්‍රාග්ධනයක් අවශ්‍ය වීම.
(2) මව් ශාකයට සමාන පැළ රාශියක් ලබා ගත හැකි වීම.
(3) වසර පුරා පැළ නිපදවීමට හැකි වීම.
(4) නිරෝගී පැළ ලබා ගැනීමට හැකි වීම.

33. සූර්ය ප්‍රචාරක තුළ දඬු කැබලි සිටුවීමෙන් මුල් අද්දවා ගැනීම වේගවත් වේ. මෙය හේතු වනුයේ,

(1) ඒ තුළ ජල වාෂ්ප එකතු වී ආර්ද්‍රතාවය වැඩි වන නිසාය.
(2) පළිබෝධ හානි අඩු වන නිසා ය.
(3) ඒ තුළ උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය වැඩි නිසාය.
(4) බාරින් සිදුවන පරිසර හානි අඩු නිසාය.

34. මුල් ගිල්වූ වගා ක්‍රමය භාවිතා කිරීමට වඩාත් සුදුසු බෝග තෝරන්න.

(1) බටු , මිරිස් හා තක්කාලි (2) කරවිල , වැටකොළු , පතෝල
(3) කංකුං , සලාද , ස්ට්‍රෝබෙරි (4) මෑ , බෝංචි , දඹල

35. ගොවිතැන් ක්‍රම හා සම්බන්ධ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ.

A වර්ෂාපතන රටාව අනුව හේන් ගොවිතැන සිදු කරයි.
B ගොවිපළ තුළම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සමෝධානික ගොවිතැන් ක්‍රමයේ වාසියකි.
C රනිල, ධාන්‍ය, අල හා එළවළු බෝග මාරු කරමින් වගා කිරීම මිශ්‍ර බෝග වගාවයි.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි පිළිතුර වනුයේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) A,B හා C ය.

36. බෝගවල පෙර අස්වනු හානි ඇතිවීමට බලපාන සාධකයක් **නොවන්නේ,**

(1) අක්‍රමවත් ජල සම්පාදනයයි.
(2) අවිධිමත් ලෙස කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතයයි.
(3) අක්‍රමවත් පොහොර භාවිතයයි.
(4) අක්‍රමවත් ලෙස අස්වනු ගබඩා කිරීමයි.

37. බිත්තර නිෂ්පාදනයට වඩාත් සුදුසු කුකුළු වර්ගයන් වනුයේ,

(1) ලෙගෝන් හා හයිසෙක්ස් (2) ලෝමාන් හා ෂේවර්
(3) R.I.R හා ඔස්ට්‍රලොප් (4) හයිලයින් හා හබර්ඩ්

38. කුකුළු ගොවිපළක සතුන් හට ලේ මිශ්‍ර පාචනය, මලානික බව, ආහාර අරුචිය, නිෂ්පාදනය අඩු වීම වැනි ලක්ෂණ දැක ගැනීමට හැකි විය. මෙයට හේතුව විය හැක්කේ,

(1) රානිකට් රෝගයයි. (2) කොක්සිඩියෝසිස් රෝගයයි.
(3) පුල්ලෝරම් රෝගයයි. (4) කුකුල් වසූරිය රෝගයයි.

39. කිරි නිෂ්පාදනය වැඩිම යුරෝපීය එළ ගව වර්ග තෝරන්න.

(1) රතු සින්දි (2) ජර්සි (3) ෆ්‍රිෂියන් (4) සහිවාල්

40. පුද්ගලයෙකුගේ ශරීර ස්කන්ධ දර්ශකය (BMI) ගණනය කෙරෙන නිවැරදි සමීකරණය දැක්වෙන පිළිතුර වන්නේ,

(1) ශරීර බර (kg) / උස$^2$ (m) (2) ශරීර බර (kg) / උස (m)
(3) ශරීර බර$^2$ (kg) / උස$^2$ (m) (4) ශරීර බර$^2$ (kg) / උස (m)

## කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය
## II කොටස

❖ **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01. බෝගයකින් උපරිම අස්වනු ලබා ගැනීමට නිසි පරිදි පොහොර යෙදීම හා පළිබෝධ පාලනය ආදී පශ්චාත් කටයුතු ක්‍රමවත්ව සිදු කළ යුතු වේ.

(i) a) බෝගවලට පොහොර මගින් ලබා දිය යුතු ප්‍රධාන පෝෂක තුන නම් කරන්න.

b) මේරු ශාක පත්‍ර කහ පැහැයට පත් වන්නේ ඉහත කුමන පෝෂකය ඌන වීමෙන් ද?

(ii) කාබනික පොහොර පසට යෙදීමෙන් පසේ දියුණු වන ලක්ෂණ 2 ක් සඳහන් කරන්න.

(iii) a) වල් පැළෑටි නිසා බෝග ශාකවලට සිදුවන හානියක් සඳහන් කරන්න.

b) වගා බිම තුළ ඇති වල් පැළෑටි පාලනය කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න.

(iv) හිටුමැරීම සොලනේසි කුලයේ බෝගවලට බහුලව වැළඳෙන රෝගයකි.

a) එම රෝගයේ රෝග කාරකයා නම් කරන්න.

b) රෝගය පාලනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න.

(v) සම්පූර්ණ රූපාන්තරණය සහිත කෘමි සතෙකුගේ ජීවන චක්‍රයේ අවස්ථා පිළිවෙළින් නම් කරන්න.

(vi) මිරිස් බෝගයට වැළඳෙන කොළ කොඩවීම රෝගය ඇති කරන රෝග වාහක කෘමීන් දෙදෙනෙක් නම් කරන්න.

(vii) දුඹුරු පැළ කීඩෑ හානියට ලක් වූ වී වගාවක ලක්ෂණ 2 ක් නම් කරන්න.

(viii) භූ තල ජල සම්පාදන ක්‍රම දෙකක් නම් කරන්න.

(ix) a) නිවසේදී සාදා ගත හැකි පළිබෝධ නාශක වර්ගයක් සඳහන් කරන්න.

b) රසායනික පළිබෝධ නාශක භාවිතයේ ගැටළුවක් සඳහන් කරන්න.

(x) ඒකාබද්ධ පළිබෝධ පාලනය යනු කුමක් ද?

02. බෝග වගාවේදී ප්‍රභාසංස්ලේෂණය, උත්ස්වේදනය ඇතිවීම මෙන්ම බීජ ප්‍රරෝහණයට ද බලපාන උෂ්ණත්වය ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ.

(i) එසේ වෙනස්වීමට බලපාන හේතුන් 3 ක් ලියන්න.

(ii) උෂ්ණත්වය බෝග වගාවට දක්වන හිතකර හා අහිතකර බලපෑම් 02 බැගින් ලියන්න.

(iii) දවසේ පවතින උපරිම උෂ්ණත්වය හා අවම උෂ්ණත්වය මැන ගැනීමට යොදා ගත හැකි උපකරණය නම් කරන්න.

(iv) නිවැරදි පාඨාංක ලබා ගැනීම සඳහා පහත උපකරණ පොළව මට්ටමේ සිට කොපමණ උසකින් ස්ථානගත කළ යුතු ද?

a) සරල වර්ෂාමානය b) අනිල මානය c) උෂ්ණත්ව මානය

03. බෝග වගා කිරීමේදී පාංශු සාධක පිළිබඳව අවධානය යොමු කිරීමෙන් ගොවියාට සැලසෙන වාසි බොහෝ ඇත.

(i) a) බෝග වගාවට පස් අංශු අතර ඇති වාතය වැදගත් වන ආකාර 2 ක් ලියන්න.

b) බෝග වගා කර ඇති භූමියක පාංශු තෙතමනය ආරක්ෂා කිරීමට ගන්නා ක්‍රියාමාර්ග 2 ක් සඳහන් කරන්න.

(ii) a) ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය මගින් සිදුවන පාංශු ඛාදන ආකාර 2 ක් ලියන්න.

b) පාංශු ඛාදනයේ අහිතකර ප්‍රතිඵල මොනවාද?

(iii) පසේ ආම්ලිකතාව ඉවත් කර පස උදාසීන කිරීමට යෙදිය හැකි ද්‍රව්‍ය දෙකක් ලියන්න.

04. ශාක කොටස් කෘත්‍රිම වර්ධක ප්‍රචාරණයට ලක් කර පැළ බෝ කර ගැනීම වර්තමානයේ ජනප්‍රියව පවතී.

(i) a) අතු බැඳීමෙන් පහසුවෙන් පැළ බෝ කර ගත හැකි ශාක 2 ක් නම් කරන්න.

b) අතු බැඳීමේ වාසි දෙකක් ලියන්න.

(ii) බද්ධ කිරීම සඳහා ගන්නා සුදුසු අනුජයක ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(iii) පැළුම් රිකිලි බද්ධයේ පියවරයන් නම් කළ රූප සටහනකින් දක්වන්න.

(iv) අංකුර බද්ධ ක්‍රම දෙකක් සඳහන් කරන්න.

05. ශ්‍රී ලංකාවේ එළවළු හා පලතුරු අස්වනුවලින් 30% - 40% පමණ පසු අස්වනු හානි නිසා අපතේ යන බව වාර්තා වේ. එම නිසා එළවළු හා පලතුරු පරිරක්ෂණය කිරීම, නිෂ්පාදනය මෙන්ම වැදගත් වේ.

(i) a) ඉහත බෝග අස්වනු නෙළීමේ සිට පරිභෝජනය තෙක් හානි සිදුවිය හැකි අවස්ථා නම් කරන්න.

b) පලතුරු පරිරක්ෂණය කිරීමේ වාසි දෙකක් සඳහන් කරන්න.

(ii) a) ජෑම් සෑදීම සඳහා භාවිතා කළ හැකි පලතුරු වර්ග දෙකක් නම් කරන්න.

b) ඒ සඳහා භාවිතා කරන පරිරක්ෂක ද්‍රව්‍යයක් නම් කරන්න.

(iii) a) අස්වනු හානිය නිසා ගොවියාට සිදුවන අවාසියක් ලියන්න.

b) අස්වනු ගබඩා කිරීමේදී සැලකිය යුතු කරුණු දෙකක් ලියන්න.

06. ආහාරයක ගුණාත්මක බව වැඩි කර ගැනීමට පෝෂකයක් හෝ පෝෂක කිහිපයක් එකතු කර ගැනීම ආහාරවල අගය වැඩි කරයි. ඇතැම් විට එය මිනිස් සිරුරට අහිතකර ක්‍රියාවලියක් ද විය හැකියි.

(i) ආහාරයක අගය වැඩි කිරීමේ වැදගත්කම් දෙකක් දක්වන්න.

(ii) ආහාරයක අගය වැඩි කරන පහත ක්‍රම මගින් ආහාරයක ගුණාත්මක බව වැඩි කරන අවස්ථාව බැගින් ලියන්න.
a) සරු කිරීම b) ප්‍රබල කිරීම

(iii) ආහාරයක අවම සැකසීමට පොදු වූ ක්‍රියාකාරකම් දෙකක් ලියන්න.

(iv) a) ආහාරවලට යොදන රසායනික පරිරක්ෂක ද්‍රව්‍ය මගින් ඇති විය හැකි සෞඛ්‍ය ගැටලු දෙකක් ලියන්න.

b) වියළීම මගින් කල් තබා ගත හැකි ආහාර වර්ග දෙකක් ලියන්න.

07. සත්ව පාලනය ජීවිකාව කරගත් ගොවි මහතෙකු කුකුළු නිවාසවල බිමට දහයියා අතුරා ඒ මත කිකිළියන් ඇති කිරීම සිදු කළ අතර එළ ගවයින් රාත්‍රී කාලයේ නිවාස වල බැඳ දමන ලදී.

(i) a) මෙම කුකුළන් ඇති කිරීමේ ක්‍රමය කුමන නමකින් හැඳින්වේද?

b) මෙම ක්‍රමයට කුකුළන් ඇති කිරීමේ වාසි දෙකක් සඳහන් කරන්න.

(ii) a) අතුරුණුව සඳහා දහයියා වෙනුවට භාවිතා කළ හැකි වෙනත් ද්‍රව්‍යයක් නම් කරන්න.

b) අතුරුණුව වියළීම පිරිසිදුව පවත්වා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග දෙකක් නම් කරන්න.

(iii) a) ඉහත ගවයින් ඇති කිරීමේ ක්‍රමය කුමක් ද?

b) පිරිසිදු කිරි ලබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගයක් ලියන්න.

c) ක්ෂුද්‍ර ජීවීන් යොදාගෙන නිපදවිය හැකි කිරි නිෂ්පාදන දෙකක් සඳහන් කරන්න.

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## පෙර'ඹරට සවියක් ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

**කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය** | **11 ශ්‍රේණිය** | **කාලය : පැය 01 යි**

# I කොටස

| | | | |
|---|---|---|---|
| 01 - 3 | 11 - 2 | 21 - 2 | 31 - 2 |
| 02 - 4 | 12 - 2 | 22 - 1 | 32 - 1 |
| 03 - 1 | 13 - 1 | 23 - 3 | 33 - 3 |
| 04 - 2 | 14 - 4 | 24 - 4 | 34 - 3 |
| 05 - 1 | 15 - 2 | 25 - 2 | 35 - 1 |
| 06 - 2 | 16 - 3 | 26 - 4 | 36 - 4 |
| 07 - 3 | 17 - 1 | 27 - 4 | 37 - 1 |
| 08 - 2 | 18 - 2 | 28 - 3 | 38 - 2 |
| 09 - 3 | 19 - 3 | 29 - 2 | 39 - 3 |
| 10 - 4 | 20 - 4 | 30 - 1 | 40 - 1 |

***

# II කොටස
## ව්‍යුහගත රචනා

01. (i) a) N,P,K b) N

(ii)
* පාංශු ව්‍යුහය දියුණු වීම.
* පසේ ජල අවශෝෂණය වැඩිවීම.
* පසේ කැට අයන හුවමාරු ධාරිතාව වැඩිවීම.
* pH අගය නොවෙනස්ව පවත්වා ගැනීමට හැකි වීම.

(iii) a)
* පෝෂක, හිර උළිය, ජලය, ඉඩකඩ සමඟ තරඟ කිරීම.
* වල් බීජ අස්වැන්නට කලවම් වීම.
* කෘමි පළිබෝධවල ජීවන චක්‍ර සම්පූර්ණ කිරීමට වල් පැළෑටි දායක වීම.
* රෝග කාරක වලට ධාරක ශාක වීම.

b)
* මනාලෙස බිම් සැකසීම
* අතින් උදුරා දැමීම.
* පසට වසුන් යෙදීම.
* බෝගවල නිසි පරතරය පවත්වා ගැනීම.
* උදලු ගෑම.

(iv) a) බැක්ටීරියා (සියුඩොමොනාස්)

b)
* බෝග මාරුව
* මනා ජල වහනය
* ප්‍රතිරෝධී ප්‍රභේද වගාව
* රෝගී ශාක ඉවත් කිරීම.

(v)






(vi) කුඩිත්තා, පැළ මැක්කා, සුදු මැස්සා, මයිටාවා

(vii) පැළ මිය යාම, කීඩෑ පිළිස්සීම, වෘත්තාකාර කොටස් පිළිස්සී දක්නට ලැබීම.

(viii) ලියදි, ඇලි හා වැටි, තීරු ජල සම්පාදනය, බේසම් හා වළලු ජල සම්පාදනය

(ix) a) කොහොඹ ඇට යුෂ මිශ්‍රණය, කොච්චි සාරය, දුම්කොළ සාරය, සබන් භූමිතෙල් මිශ්‍රණය

b) හිතකර කෘමීන් විනාශ වීම, පරිසරය දූෂණය වීම, යෙදූ බෝග අස්වැන්න පරිභෝජනය කිරීමෙන් මිනිසාට රෝග ඇති වීම.

(x) පළිබෝධ පාලනයේදී යාන්ත්‍රික, ශෂ්‍ය විද්‍යාත්මක, ජෛව හා නිරෝධායන ක්‍රම උචිත අවස්ථාවේදී යොදා පළිබෝධ පාලනය කිරීම.

02. (i) සමකයේ සිට ඇති දුර, උච්චත්වය , මුහුදේ සිට ඇති දුර , අභ්‍යන්තර ජලාශ පිහිටීම , මිනිස් ක්‍රියාකාරකම්

(ii)

| හිතකර බලපෑම් | අහිතකර බලපෑම |
|---|---|
| * බීජ ප්‍රරෝහණයට | * උෂ්ණත්වය වැඩි වූ විට පූටිකා වැසීම. |
| * දඬු කැබලි මුල් අද්දවා ගැනීමට | * උත්ස්වේදනය වැඩි වීමෙන් ශාක මැලවීම. |
| * ප්‍රභාසංස්ලේෂණයට | * උෂ්ණත්වය වැඩිවීමෙන් පුෂ්ප පරාග වියළීම |
| * ශාක උත්ස්වේදනයට | * අඩු උෂ්ණත්වයේදී ශාක සෛලවල ජලය මිදී පුපුරා යාම. |

(iii) උපරිම හා අවම උෂ්ණත්වමානය

(iv) a) 30cm b) 2m

03. (i) a)
* බීජ ප්‍රරෝහණයට
* ශාක මුල්වල ශ්වසනයට
* කාබනික ද්‍රව්‍ය වියෝජනයට
* පාංශු ජනනයට

b)
* පසට කාබනික පොහොර කලවම් කිරීම.
* වසුන් යෙදීම.
* ආවරණ වගා කිරීම.

(ii) a)
* විසිර බාදනය
* ස්ථරීය බාදනය
* ඇලි බාදනය
* ඇගිලි බාදනය
* දියපහර බාදනය

b)
* පාංශු ස්ථර සනකම අඩුවීම
* ශාකවල පෝෂණ ඌනතා ඇතිවීම.
* ශාක ඇද වැටීම.
* ඉඩම් වටිනාකම අඩු වීම.

(iii) * ආම්ලික පොහොර යෙදීමෙන් වැළකීම, ඩොලමයිට් , හුණුගල්

04. (i) a) ලෙමන්, දෙහි, දෙළුම් , වද , රෝස

b) * පහසුවෙන් නව ශාකයක් බිහි කර ගැනීම.

* පැළ ආරක්ෂා සහිතව ප්‍රවාහනය කළ හැකිවීම.
* ඉහළ තාක්ෂණික දැනුමක් අවශ්‍ය නොවීම.
* මව් ශාකයේ ලක්ෂණ ඇති ශාකයක් වීම.

(ii) * ගුණාත්මක බවින් යුක්ත වීම.
* ඉහළ අස්වැන්නක් සහිත වීම.
* නිරෝගී හා පළිබෝධ හානිවලින් තොර වීම.
* ග්‍රාහක කඳේ විෂ්කම්භයට ගැලපීම.

(iii)

පැලැස්තර බද්ධය, H බද්ධය , උඩුකුරු T බද්ධය , යටිකුරු T බද්ධය

05. (i) a) * පරිණතියට පෙර අස්වනු නෙළීම.
* පරිණතියෙන් පසු අස්වනු නෙළීම.
* හිරු එළියට මැලවීම
* යාන්ත්‍රික හානි
* අස්වනුවල කිරි තැවරීම.
(තවද ඇසිරීම, ප්‍රවාහනයේදී, ගබඩා කිරීමේදී හානිවන අවස්ථා ඇත.)

b) * අතිරික්තය ප්‍රයෝජනයට ගැනීමට හැකි වීම.
* වසර පුරා භාවිතයට හැකි වීම.
* වෙළඳපොළ ඉල්ලුමට සරිලන පරිදි සැපයීමට හැකි වීම.
* ක්ෂණික භාවිතා කළ හැකි වීම.
* ස්වයංරැකියා හා රැකියා අවස්ථා බිහිවීම.

(ii) a) පැෂන් ෆෘට් , අන්නාසි , දිවුල් , අඹ
b) සීනි, සෝඩියම් බෙන්සෝඒට්, සෝඩියම් මෙටා බයිසල්ෆයිඩ්

(iii) a) ආදායම අඩු වීම.
b) * නියමිත උෂ්ණත්වය ගබඩාවේ තිබීම.
* අස්වනු හා ගබඩාව පිරිසිදු විය යුතුයි.
* නියමිත වාතාශ්‍රය තිබීම.
* අදාල බෝග වර්ග අනුව ගබඩා වෙන් කිරීම.

06. (i) * පෝෂක ඌනතා ඇති වීම වැළැක්වීම.
* ආහාරවල ගුණාත්මක බව වැඩි කිරීම.
* ආහාර සකස් කිරීමේදී හානිවන පෝෂක නැවත ලබා දීම.
* ආහාරවල පෝෂක අවශෝෂණය පහසු කිරීම.
* වෙළඳපොළ ඉල්ලුම වැඩි කිරීම.

(ii) a) සරු කිරීම - කිරිපිටි සඳහා විටමින් එකතු කිරීම.
b) ප්‍රබල කිරීම - ලුණුවල I එකතු කිරීම.

(iii) * තේරීම

* පිරිසිදු කිරීම.
* අත්‍යවශ්‍ය කොටස් ඉවත් කිරීම.
* අවශ්‍ය ප්‍රමාණයට සැකසීම.

(iv) a) පෙනහළු හා ශ්වසන පද්ධතියේ ආබාධ
බඩේ දැවිල්ල , පිපාසය, හිසරදය , අධික රුධිර පීඩනය

b) මාළු , මිරිස් , දියර කිරි , පිටි

07. (i) a) ඝන ආස්තරණ ක්‍රමය

b)
* ඒකීය ඉඩක වැඩි සතුන් ප්‍රමාණයක් ඇති කිරීම.
* බෝගවලට හානියක් නැත.
* විලෝපික හානි අඩුය.
* බිත්තර පිරිසිදුව හා සුරක්ෂිතව ලබා ගැනීම.
* පාලනය පහසු වීම.
* ආස්තරණය පොහොර ලෙස ගැනීමට හැකි වීම.

(ii) a) කුඩාවට කපන ලද පිදුරු, රටකඩු පොතු, යතු කුඩු

b)
* 10cm පමණ ආරම්භ කර 25cm පමණ තෙක් පිරවීම.
* ජලය වැටීම වැළැක්වීම.
* $1m^2$ ට අළු හුණු 550g ක් යෙදීම.
* දිනපතා රේක්ක කිරීම.
* ජලයෙන් තෙමුණු කොටස් ඉවත් කිරීම.

(iii) a) අඩ සියුම් ක්‍රමය

b)
* බුරුල්ල, භාජන, ස්ථානය පිරිසිදුව තබා ගැනීම.
* කිරි ගැනීම ආරම්භයේ ස්ට්‍රිප් කප් පරීක්ෂාව

c) මුදවපු කිරි, යෝගට්, චීස්

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## පෙර'ඹරට සවියක් ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

| කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය | 11 ශ්‍රේණිය | කාලය : පැය 03 යි |
|---|---|---|

### I කොටස

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ ගැළපෙන අංකයට (×) ලකුණ යොදන්න.

01. ශ්‍රී ලංකාවේ ප්‍රථම බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය ලෙස සලකනු ලබන්නේ,
(1) මහවැලි සංවර්ධන ව්‍යාපාරයයි. (2) මව් ආර සංවර්ධන ව්‍යාපාරයයි.
(3) ලුණුගම් වෙහෙර සංවර්ධන ව්‍යාපාරයයි. (4) ගල් ඔය සංවර්ධන ව්‍යාපාරයයි.

02. වැවක වැව් බැම්මට ජලය මගින් ඇති වන පීඩනය අවම කරමින් වාරි ජලය මුදා හැරීමට ඉදි කරන ලද සුවිශේෂ නිර්මාණයකි,
(1) සොරොව්ව ය. (2) රළ පනාව ය. (3) බිසෝ කොටුවය. (4) දියකැට පහණය.

03. සංවහන වර්ෂාවේ විශේෂ ලක්ෂණ සේ සැලකෙන්නේ,
(1) සවස් කාලයේ ගිගිරුම් සහිත තද වර්ෂාව රාත්‍රී කාලයේ දී පැහැදිලි අහස දක්නට ලැබීම.
(2) දවසේ ඕනෑම වේලාවක තද වර්ෂා පතනයක් පැවතීම.
(3) තද සුළං සහිත තද වර්ෂාපතනයක් පැවතීම.
(4) කෙටි කාලයක් තුළ අධිකව වර්ෂාව ඇති වීම.

04. සූර්යාලෝකයේ විවිධ වර්ණ ශාකවල විවිධ ක්‍රියාකාරී අවස්ථා සඳහා උපකාරී වේ. නිල් හා රතු ආලෝකය පහත කුමන කාරණය සඳහා බලපානු ලබයිද?
(1) අතු බෙදීම හා බීජ ප්‍රරෝහණයට (2) ප්‍රභාසංස්ලේෂණයට
(3) කඳේ පර්ව හා බීජධරයේ වර්ධනයට (4) මූල මණ්ඩලයේ වර්ධනයට

05. අනුරාධපුරය, පොළොන්නරුව හා මොණරාගල වැනි වියළි කලාපීය ප්‍රදේශවල බහුලව පැතිරී ඇති පස් කාණ්ඩයකි,
(1) රතු දුඹුරු පස ය. (2) රතු කහ පොඩ්සොලික් පසය.
(3) රෙගසෝල් පස ය. (4) දියළු පස

06. පාංශු ඛාදනයට හේතු වන පාංශු ඛාදන කාරකයක් නොවන්නේ,
(1) ගලා යන වර්ෂා ජලය (2) මුහුදු රළ හා ගංගා රළ
(3) වේගවත් සුළඟ (4) පසේ pH අගය

07. පාංශු පැතිකඩක කාබනික ද්‍රව්‍ය බහුලව අඩංගු වන්නේ,
(1) A කලාපය හෙවත් විශෝධන කලාපය
(2) B කලාපය හෙවත් සංචායක කලාපය
(3) C කලාපය හෙවත් මාතෘ ද්‍රව්‍ය කලාපය
(4) R කලාපය හෙවත් මාතෘ පාෂාණ කලාපය

08. මාෂ බෝග පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
(1) වී, කුරක්කන් හා බඩ ඉරිඟු ය. (2) මුං , කඩල හා කව්පි ය.
(3) බෝංචි , මෑ , බඩඉරිඟු ය. (4) බටු, මිරිස් හා තක්කාලි ය.

09. ශාක මුල්වල හට ගන්නා මූල ගැටිති තුළ ජීවත් වන බැක්ටීරියා මගින් පසට නයිට්‍රජන් ලබා දෙන ශාක කුලය වනුයේ,
(1) පොඒසියේ කුලය (2) ෆැබේසියේ කුලය
(3) සොලනේසියේ කුලය (4) කුකර්බිටේසියේ කුලය

10. පොල් හා කෙසෙල් වගාවන්වල පැළ සිටුවිය යුතු නියමිත පරතරය පිළිවෙළින් සඳහන් පිළිතුර වනුයේ,
(1) $8m \times 8m$ හා $3m \times 3m$ ය. (2) $10m \times 10m$ හා $8m \times 8m$ ය.
(3) $3m \times 3m$ හා $2m \times 2m$ ය. (4) $8m \times 8m$ හා $5m \times 5m$ ය.

11. තද පසක් ඇති ක්ෂේත්‍රයක මූලික බිම් සකස් කිරීම සඳහා යොදා ගැනීමට වඩාත් සුදුසු උපකරණයකි,
(1) රොටවේටරය (2) කොකු නගුල (3) ගැමි ලී නගුල (4) තැටි නගුල

12. දෙපේලි ක්‍රමයට සිටුවීමට වඩාත් සුදුසු පලතුරු බෝගයකි,
(1) කෙසෙල් (2) අන්නාසි (3) පැපොල් (4) පැෂන් ෆෲට්

13. තවාන් පාත්තියක සම්මත දිග, පළල හා උස පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,
(1) $1m \times 1m \times 10cm$ (2) $2m \times 1m \times 15cm$
(3) $3m \times 1m \times 15cm$ (4) $3m \times 1m \times 30cm$

14. රෝපණ ද්‍රව්‍ය සිටුවා ප්‍රරෝහණයට හා පැළ වර්ධනයට හිතකර පරිසරයක් ලබා දෙමින් ක්ෂේත්‍රයේ සිටුවීමට සුදුසු තත්වයට පත් වන තෙක් රැක බලා ගන්නා ස්ථානය හඳුන්වන්නේ,
(1) සුදුසු වගා ස්ථානයක් ලෙසය. (2) තවානක් ලෙසය.
(3) නිර්පාංශු වගාවක් ලෙසය. (4) වගා කුළුණක් ලෙසය.

15. අර්ධව පිළිස්සුණු දහයියා තවාන් මිශ්‍රණයට කලවම් කිරීමෙන් පාලනය කළ හැකි රෝගී තත්ත්වය වන්නේ,
(1) දිලීර රෝග වේ. (2) බැක්ටීරියා රෝග වේ.
(3) වෛරස් රෝග වේ. (4) වටපණු රෝග වේ.

16. ජල සම්පාදනය පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) එකොළොස්වැනි දප්පුල රජ සමයේ ජල කළමනාකරණය පිළිබඳ පැවති නීති සෙල්ලිපියකින් හමුවී ඇත.
(2) සෑම විටම බෝගයේ පත්‍ර හා මුල් පද්ධතියට ජල සම්පාදනය කළ යුතු වේ.
(3) පිටාර ජල සම්පාදනය එළවළු වගාවට ද යොදා ගත හැකිය.
(4) භූගත ජල සම්පාදනය අඩු වියදමකින් සිදු කළ හැකිය.

17. පහත සඳහන් ක්‍රම අතුරින් කාර්යක්ෂම ජල සම්පාදන ක්‍රමය වන්නේ,
(1) පිටාර ජල සම්පාදනයයි. (2) බේසම් ජල සම්පාදනයයි.
(3) බිංදු ජල සම්පාදනයයි. (4) ඇලි ජල සම්පාදනයයි.

18. වගා බිමක පොහොර භාවිත කාර්යක්ෂමතාව වැඩිකිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A පසේ තෙතමනය පවතින විට පොහොර යෙදීම.
B රසායනික පොහොර සහ කාබනික පොහොර මිශ්‍ර කර පසට යෙදීම.
C බෝගයේ අවශ්‍යතාව සලකා බලා පොහොර යෙදීම
D පසේ ආම්ලිකතාවය වැඩි අවස්ථාවලදී පොහොර යෙදීම.
මෙම ප්‍රකාශවලින් සත්‍ය වනුයේ,
(1) A,B,C පමණි. (2) ACD පමණි. (3) BCD පමණි. (4) A,B,C,D සියල්ලමය.

19. නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම් යන මූලද්‍රව්‍ය තුන ලබා දීමේ අරමුණින් භාවිතා කළ හැකි පොහොර වන්නේ පිළිවෙළින්,
(1) යූරියා, සාන්ද්‍ර සුපර් පොස්පේට්, ඇමෝනියම් සල්පේට්
(2) යූරියා, සාන්ද්‍ර සුපර් පොස්පේට්, මියුරියේට් ඔෆ් පොටෑෂ් ය.
(3) ඇමෝනියම් සල්ෆේට්, මියුරියේට් ඔෆ් පොටෑෂ්, එප්පාවල ඇපටයිට් ය.
(4) මියුරියේට් ඔෆ් පොටෑෂ් , එප්පාවල ඇපටයිට්, යූරියා ය.

20. කරවිල වගාවක පෙරමෝන උගුලක් සවි කිරීමෙන් පාලනය කිරීමට බලාපොරොත්තු වන පළිබෝධකයා වන්නේ,
(1) අවුලකපෝරා (2) කුඩිත්තා (3) ඉල්මැස්සා (4) පලතුරු මැස්සා

21. ඒකාබද්ධ පළිබෝධ පාලනයේ දී,
(1) පළිබෝධ හානියක් හට ගත් විගස රසායන ද්‍රව්‍ය යොදා පාලනය කරයි.
(2) කිසිම අවස්ථාවක පළිබෝධ නාශක නොයොදයි.
(3) පළිබෝධ ගහනය ආර්ථික හානිදායි මට්ටමට පහළින් තබා ගනී.
(4) පළිබෝධ ගහනය 50% දක්වා අඩු වන තෙක් පළිබෝධ නාශක යොදයි.

22. පහත සඳහන් වල් පැළෑටි කාණ්ඩවලින් මර්දනයට අපහසු වල් පැළෑටි කාණ්ඩය වන්නේ,
(1) නිදිකුම්බා සහ කටු තම්පලා (2) කළාදුරු සහ ඉළුක්
(3) මොනරකුඩුම්බිය සහ ඇටවරා (4) හුලංතලා සහ කළාදුරු

23. ලංකාවේ පැරණි වී වර්ගවල ලක්ෂණයක් වන්නේ,
(1) පඳුරු දැමීම වැඩිය. (2) රසායන පොහොරවලට ඉහළ ප්‍රතිචාරයක් දක්වයි.
(3) වී ශාක මිටි ස්වභාවයක් දක්වයි. (4) රෝග හා පළිබෝධකවලට ප්‍රතිරෝධීය.

24. සහතික කරන ලද බිත්තර වී වල ප්‍රමිතිය පිළිබඳව දැක්වෙන ප්‍රකාශ අතරින් **වැරදි ප්‍රකාශය** තෝරන්න.
(1) පැළවීමේ ප්‍රතිශතය අවම 85% කි. (2) තෙතමනය උපරිම 13% කි.
(3) වර්ග පවිත්‍රතාව බර අනුව 98% කි. (4) වී 500g තිබිය හැකි උපරිම වල් පැළ බීජ ප්‍රමාණය 500කි.

25. ස්වභාවික වර්ධක ප්‍රචාරණයට උදාහරණයක් **නොවන්නේ,**
(1) පත්‍ර මගින් පැළ ඇති වීමයි. (2) ශාක මුල්වලින් පැළ ඇති වීමයි.
(3) අතු බැඳීමෙන් පැළ ලබා ගැනීමයි. (4) ධාවක මගින් පැළ ඇති වීමයි.

26. බද්ධ කිරීමකදී එය සාර්ථකව සිදු කිරීමට අනුජය හා ග්‍රාහකය යන කොටස්වල කිනම් පටක වර්ගය ස්පර්ශ විය යුතුද?
(1) සෛලම පටකය (2) ප්ලෝයම පටකය (3) කැම්බියම පටකය (4) බාහික පටකය

27. බෝග වගාව සඳහා පහත රට තෙත් කලාපයේ තනන ලද පොලිතින් ගෘහයක උෂ්ණත්වය පාලනය කිරීමට වඩාත් උචිත ක්‍රමයක් වන්නේ,
(1) අවට සෙවන ගස් සිටුවීමය. (2) වහලය මුදුන මට්ටම් දෙකකට සැකසීමය.
(3) UV ප්‍රතිරෝධී පොලිතින් වහලයට ඇතිරීමය. (4) නිතර ජල සම්පාදනය කිරීමය.

28. පොලිතින් ගෘහ භාවිතා කර වගා කිරීමේ වාසියක් **නොවන්නේ,**
(1) දැල්වල හා පොලිතිනයේ ඇල්ගී වර්ධනය වීම.
(2) ගුණාත්මක හා ප්‍රමාණාත්මක බවින් ඉහළ අස්වනු ලැබීම.
(3) බෝගයට පෝෂණය සැපයීමට පහසු වීම.
(4) රෝග හා කෘමි හානි අවම වීම.

29. ශාක දඬු කැබලි මුල් අද්දවා ගැනීමට වඩාත් සුදුසු වන්නේ,
(1) දැල් ගෘහ තුළය. (2) සූර්ය ප්‍රචාරක ව්‍යුහයක් තුළය.
(3) පොලිතින් බඳුන් තුළය. (4) තවාන් පාත්තියකය.

30. ශෂ්‍ය මාරු ගොවිතැන් ක්‍රමයේදී පසේ ගැඹුරු ස්ථරවලින් පෝෂක උරා ගැනීම සඳහා වගා කරනු ලබන බෝග වර්ගය,
(1) කුරක්කන් (2) කව්පි (3) වම්බටු (4) බතල

31. හේන් ගොවිතැනෙහි විශේෂ ලක්ෂණයකි,
(1) බෝග මාරුව සිදු කිරීම (2) ක්‍රමානුකූලව බිමම්සකසා බෝග සිටුවීම.
(3) පාංශු සංරක්ෂණ ක්‍රම යොදා ගැනීම. (4) වගා කරන බෝගවලට පොහොර නොයෙදීම.

32. පහත ප්‍රකාශ සලකා බලන්න.

A අස්වනු හානිය වැළැක්වීමට නියමිත පරිණත අවස්ථාවේ අස්වනු නෙළීම කළ යුතුය.

B අස්වනු හානිය වැළැක්වීමට එල ආවරණය වැදගත් වේ.

C පළාවර්ග හිරු එළියේ අස්වනු නෙළීම නුසුදුසුය.

මේ අතරින් සත්‍ය වන්නේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) A,B හා C සියල්ලමය.

33. පලතුරු ගබඩාවක පවත්වා ගත යුතු තත්ත්ව වන්නේ,

(1) ඉහළ උෂ්ණත්වය හා පහල ආර්ද්‍රතාවය (2) පහල උෂ්ණත්වය හා ඉහළ ආර්ද්‍රතාවය

(3) පහළ උෂ්ණත්වය හා පහළ ආර්ද්‍රතාවය (4) ඉහළ උෂ්ණත්වය හා ඉහළ ආර්ද්‍රතාවය

34. යකඩ ඛනිජය බහුලව අඩංගු වන වරණය ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) මස් හා තද කොළ පැහැති එළවළු හා පළා වර්ග (2) කිරි හා ධාන්‍ය වර්ග

(3) මස් හා පලතුරු වර්ග (4) බිත්තර හා එළවළු වර්ග

35. මිනිස් සිරුරේ පහත තත්ත්වයන් ඇති වීමට හේතු වන්නේ,

A තයිරොක්සින් නිෂ්පාදනය අඩුවීම.

B ගලගණ්ඩය ඇති වීම.

C බුද්ධි වර්ධනය අඩාල වීම.

(1) ඛනිජ ඌනතාවය (2) යකඩ ඌනතාවය

(3) අයඩින් ඌනතාවය (4) කැල්සියම් ඌනතාවය

36. බහුලව ආසාත්මිකතාවය ඇති විය හැකි ආහාර කාණ්ඩය තෝරන්න.

(1) මඤ්ඤොක්කා, බතල, කිරි අල

(2) අන්නාසි, තක්කාලි, බිම්මල්

(3) පරිප්පු, මුං, කව්පි

(4) අඹ, පැපොල්, පේර

37. මස්, මාළු කල්තබා ගැනීම සඳහා අධිශීතකරණයේ තැබීම සිදු කරයි. මෙමගින් ආහාර සංරක්ෂණය වනුයේ එහි ඇති,

(1) ජලය ඉවත් වීමෙනි. (2) ක්ෂුද්‍ර ජීවීන් විනාශ වීමෙනි.

(3) ක්ෂුද්‍ර ජීවීන් අක්‍රිය වීමෙනි. (4) ක්ෂුද්‍ර ජීවීන්ට අවශ්‍ය ජලය නොලැබීමෙනි.

38. කිරි ලබා ගැනීම සඳහා ලංකාවේ ඇති කළ හැකි මී ගව වර්ගයකි,

(1) ෆ්‍රිෂියන් (2) සහිවාල් (3) රතු සිංදි (4) මුරා

39. ගව දෙනුන් හට කැල්සියම් ඌනතාවය නිසා ඇති වන රෝගී තත්ත්වයකි,

(1) කුර හා මුඛ රෝගය (2) කිරි උණ රෝගය

(3) බුරුලු ප්‍රදාහය රෝගය (4) බඩ පිපුම රෝගය

40. බිත්තර දමන කිකිළියන් පාලනයේදී පැටව් අවධිය බෲඩරයක් තුළ ඇති කරනු ලැබේ, මෙම කාලය වනුයේ,

(1) සති 1 කි. (2) සති 2 කි. (3) සති 3 කි. (4) සති 4 කි.

## කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය
## II කොටස

- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

01. වගා කටයුතු සඳහා සීමිත ඉඩ ප්‍රමාණයක් ඇති ගැමුණු මහා විද්‍යාලයේ බඳුන්ගත වගාවක් පවත්වාගෙන යාමට සැලසුම් කර ඇත.

1. බඳුන්ගත වගාවක් සඳහා යොදා ගත හැකි බඳුන් වර්ග හතරක් නම් කරන්න.
2. මෙම බඳුන් පිරවීම සඳහා යොදා ගත හැකි බඳුන් මිශ්‍රණය හා එහි අනුපාතය සඳහන් කරන්න.
3. නෙරිඩොකෝ තවානක ඇති වැදගත්කම් දෙකක් ලියන්න.
4. බඳුන්වල සිටුවීමට යෝග්‍ය සොලනේසි කුලයේ බෝග දෙකක් සඳහන් කරන්න.
5. කුකර්බිටේසි කුලයේ බෝගවලට බහුලව හානි කරන කෘමි පළිබෝධකයෙකු නම්කර මර්දනය සඳහා ගත හැකි ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න.
6. බඳුන්ගත වගාවට යෙදීම සඳහා කොම්පෝස්ට් සෑදීමට යෝග්‍ය ක්‍රම දෙකක් ලියන්න.
7. කොම්පෝස්ට් සැකසීමේදී කාබනික ද්‍රව්‍ය දිරාපත් වීම ඉක්මන් කිරීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.
8. සති අන්ත නිවාඩු දිනවලදී පැළවලට ජල සම්පාදනය කිරීම සඳහා සුදුසු ක්‍රම දෙකක් සඳහන් කරන්න.
9. බෝගවලට ජලයෙන් ඇති ප්‍රයෝජන දෙකක් ලියන්න.
10. නිර්පාංශු වගාවකට යොදා ගත හැකි ඝන මාධ්‍ය දෙකක් සඳහන් කරන්න.

02. බෝග වගාවේ ප්‍රධාන බලපෑමක් වන වර්ෂාව බිම් සැකසීමේ සිට අස්වනු නෙළන තෙක් විවිධ වූ බලපෑම් ඇති කරයි

1. ශ්‍රී ලංකාවේ වර්ෂාව ලැබෙන ප්‍රධාන ක්‍රම නම් කරන්න.
2. වර්ෂාව පදනම් කරගෙන බෙදා ඇති යල හා මහ කන්න සඳහා අදාල වන කාලවකවානු වෙන වෙනම සඳහන් කරන්න.
3. බෝග වගාවට වර්ෂාපතනය හිතකර වන ආකාර දෙකක් සඳහන් කරන්න.
4. බෝග වගාවට සුළඟ හිතකර වන ආකාර දෙකක් සඳහන් කරන්න.

03. පසක් නිර්මාණයේ දී එම ක්‍රියාවලිය පාෂාණ ජීර්ණය හා පාංශු ජනනය ලෙස ආකාර දෙකකි.

1. a) ඔබ දන්නා පාෂාණ වර්ග දෙකක් ලියන්න.
   b) පාෂාණ භෞතික ජීර්ණයට බලපාන සාධක තුනක් සඳහන් කරන්න.
2. a) පසක කැට අයන හුවමාරු ධාරිතාවය යනු කුමක් ද?
   b) කැට අයන හුවමාරු ධාරිතාවය බෝග වගාවට වැදගත් වන්නේ කෙසේද?
3. පාංශු ඛාදනය වැළැක්වීම සඳහා බෝග වගා භූමියක පස වසුන් කිරීමට යොදා ගත හැකි ශාකමය ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.

04. බෝග වර්ගීකරණය පාඩම සාකච්ඡා කිරීමේදී පහත සඳහන් ශාක කොටස් පන්ති කාමරයට ගෙනැවිත් තිබිණි.
(වී, බඩඉරිඟු, මුං, දඹල, මිරිස්, තක්කාලි, පතෝල, වට්ටක්කා)

1. a) ඉහත බෝග අතරින් පොඒසියේ කුලයට අයත් බෝග දෙකක් නම් කරන්න.
   b) ෆැබේසියේ කුලයේ බෝග දෙකක් නම් කරන්න.
   c) ෆැබේසියේ කුලයේ බෝග වගා කිරීමෙන් පස සාරවත් වන බව ගුරුතුමා පැවසීය. එය සිදුවන ආකාරය පැහැදිලි කරන්න.
2. ඉහත බෝගවලින් අවුලකපෝරා කෘමියාගෙන් හානියට ලක්වන බෝග දෙකක් සඳහන් කරන්න.
3. වියළි කලාපයේ වගා කරන ඉහත ඡේදයේ නොමැති ධාන්‍ය බෝග දෙකක් සඳහන් කරන්න.

05. මෑත කාලයේ ශ්‍රී ලංකාව තුළ ගව පාලනය හා කුකුළු පාලනයේ පැහැදිලි වර්ධනයක් ඇති බව අපට පෙනේ.

1. ශ්‍රී ලංකාව තුළ සත්ත්ව පාලනය දියුණු කිරීමට ඉවහල් වන විභවයන් 4 ක් ලියන්න.
2. a) කිරි ලබා ගැනීමට ඇති කරනු ලබන ගව වර්ග හතරක් නම් කරන්න.
   b) සත්ත්වයින් සඳහා කාබෝහයිඩ්‍රේට් හා ප්‍රෝටීන ලබා දීමට සත්ත්ව ආහාර සලාකවලට එකතු කළ හැකි ආහාර ද්‍රව්‍ය දෙක බැගින් ලියන්න.
3. a) එළදෙනුන් ගැබ් ගැන්වීම සිදු කළ හැකි ප්‍රධාන ආකාර දෙක නම් කරන්න.
   b) එළදෙනකගේ මද ලක්ෂණ හතරක් නම් කරන්න.

06. ආහාර ද්‍රව්‍ය සුරක්ෂිත ලෙස ඇසුරුම් කිරීම ඉතා වැදගත් වේ.

1. ආහාර ද්‍රව්‍ය ඇසුරුම් කිරීමේ අවශ්‍යතාවයන් හතරක් ලියන්න.
2. a) ජීවානු හරිත තත්ත්ව යටතේ අසුරණ ආහාර ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.
   b) රික්ත ඇසුරුම් සිදු කරන ආහාර ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.
3. a) ඇසුරුම් ද්‍රව්‍ය ලෙස කඩදාසි භාවිතයේ අවාසි දෙකක් ලියන්න.
   b) ආහාර ඇසුරුම් තුළට පහත වායු වර්ග ඇතුළු කිරීමේ අරමුණ කුමක් ද?
   අ) කාබන්ඩයොක්සයිඩ් වායුව ආ) නයිට්‍රජන් වායුව

07. ආහාරවල පෝෂණ ගුණය, වයනය,රසය ආදී ලක්ෂණ නොවෙනස්ව තබා ගනිමින් ආහාර කල් තබා ගැනීම ආහාර පරිරක්ෂණය ලෙස හඳුන්වයි.

1. a) ආහාර පරිරක්ෂණයේ මූලධර්ම තුන සඳහන් කරන්න.
   b) ආහාර ද්‍රව්‍යයක් වියළීම මගින් සංරක්ෂණය කරන ආකාරය විස්තර කරන්න.
2. පලතුරු ජෑම් නිෂ්පාදනයේ දීපහත සඳහන් ද්‍රව්‍ය එකතු කරන ගැනීමේ වැදගත්කම සඳහන් කරන්න.
   a) සිට්‍රික් අම්ලය b) සීනි c) පෙක්ටීන් d) සෝඩියම් මෙටා බයිසල්ෆයිට්
3. a) දුම් ගැසීමේ ක්‍රියාවලිය මගින් ආහාර ද්‍රව්‍ය සංරක්ෂණය වන ආකාරය පැහැදිලි කරන්න.
   b) ආහාර ද්‍රව්‍යයක එන්සයිමීය ක්‍රියා අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## පෙර'ඹරට සවියක් ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

**කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය** | **11 ශ්‍රේණිය** | **කාලය : පැය 01 යි**

## I කොටස

| | | | |
|---|---|---|---|
| 01 - 4 | 11 - 4 | 21 - 3 | 31 - 4 |
| 02 - 3 | 12 - 2 | 22 - 2 | 32 - 4 |
| 03 - 1 | 13 - 3 | 23 - 4 | 33 - 3 |
| 04 - 2 | 14 - 2 | 24 - 4 | 34 - 1 |
| 05 - 3 | 15 - 1 | 25 - 3 | 35 - 3 |
| 06 - 1 | 16 - 1 | 26 - 3 | 36 - 2 |
| 07 - 1 | 17 - 3 | 27 - 2 | 37 - 3 |
| 08 - 2 | 18 - 1 | 28 - 1 | 38 - 4 |
| 09 - 2 | 19 - 2 | 29 - 2 | 39 - 2 |
| 10 - 1 | 20 - 3 | 30 - 3 | 40 - 2 |

***

## II කොටස
### ව්‍යුහගත රචනා

01. (i) ප්ලාස්ටික් බඳුන්, මැටි බඳුන්, පොලිතින් බෑග්, පොල් කටු, ඉවත් කළ මැටි වලං

(ii) හලාගත් මතුපිට පස්, කොම්පෝස්ට් (1 : 1)

(iii) * පැළයේ මුල්වලට හානි නොවී පැළ ගලවා ගැනීමට හැකි වීම.
* එම නිසා පැළවල මුල්වලට හානි නොවීම.
* පැළ බාල නොවීම.

(iv) මිරිස්, වම්බටු, තක්කාලි

(v) ඉල්මැස්සා, එල පොලිතින් කවරයකින් ආවරණය කිරීම.

(vi) ගොඩ ක්‍රමය, බැරල් ක්‍රමය, වල ක්‍රමය, කෝටුරාමු ක්‍රමය

(vii) * දිරාගිය කොම්පෝස්ට් කලවම් කිරීම.
* සත්ත්ව පොහොර කලවම් කිරීම.
* ගොඩ තෙත් කිරීම.
* හොඳින් වාතාශ්‍රය ලැබෙන පරිදි ගොඩ කලවම් කිරීම.

(viii) * බිංදු ජල සම්පාදනය
* ප්ලාස්ටික් බෝතලයකට ජලය පුරවා පැළය මුල මුනින් අතට නමා තැබීම.

(ix) * බෝගයේ කායික ක්‍රියා සඳහා
* ශාක පෝෂක අවශෝෂණය සඳහා
* බීජ ප්‍රරෝහණය සඳහා
* ශාක සන්ධාරක ගුණය පවත්වා ගැනීමට

(x) කොහු බත් , වැලි , දහයියා , ගල් කුඩු

**(ලකුණු 2 x 10)**

02. (i) මෝසම් වර්ෂාව , සංවහන වර්ෂාව , වාසුළි වර්ෂාව **(ලකුණු 02)**

(ii) මහ කන්නය - දෙසැම්බර් - පෙබරවාරි

යල කන්නය - මැයි - සැප්තැම්බර් **(ලකුණු 04)**

(iii) * බිම් සැකසීමේ පහසුව * බීජ ප්‍රරෝහණයට
* පැළ වර්ධනයට * පොහොර කාර්යක්ෂමතාව වැඩි කිරීමට

**(ලකුණු 02)**

(iv) * මඳ සුළඟින් ශාක පත්‍රවල වායු හුවමාරුව පහසු වීම.
* මඳ සුළඟ පරාගණය පහසු කරයි.
* උත්ස්වේදනය වැඩි වීමෙන් ශාක පෝෂක අවශෝෂණය පහසු වේ. **(ලකුණු 02)**

03. (i) a) ආග්නේය පාෂාණ , අවසාදිත පාෂාණ, විපරිත පාෂාණ **(ලකුණු 02)**

b) * උෂ්ණත්වය වෙනස් වීම. * ජලය මිදීම. * ගලා යන ජලය
* රැළි ක්‍රියා * සුළඟ **(ලකුණු 03)**

(ii) පාංශු කලිලවලට අධිශෝෂණය වී ඇති කැටායන, පාංශු ද්‍රාවණයේ ඇති කැටායන සමඟ හුවමාරු වීමේ හැකියාව කැටායන හුවමාරු ධාරිතාව ලෙස හඳුන්වයි. **(ලකුණු 03)**

(iii) ලී කුඩු, දහයියා , වියළි තෘණ, කොහු බත් **(ලකුණු 02)**

04. (i) a) වී , බඩ ඉරිඟු **(ලකුණු 01)**
b) මුං , දඹල **(ලකුණු 01)**
c) මෙම කුලයේ බෝගවල මුල්වල හට ගන්නා මූල ගැටිතිවල ජීවත් වන බැක්ටීරියා මගින් වායුගෝලීය නයිට්‍රජන් තිර කිරීමෙන් පසට වායුගෝලීය නයිට්‍රජන් ලැබීම. **(ලකුණු 04)**

(ii) පතෝල , වට්ටක්කා **(ලකුණු 02)**

(iii) කුරක්කන් , මෙනේරි , තණහාල් **(ලකුණු 02)**

05. (i) * ගොවිපල සතුන් වර්ග කීපයක්ම අභිජනනය කර වැඩි දියුණු කිරීමට හැකි වීම.
* උසස් නිෂ්පාදන හැකියා ඇති සතුන් ඇති කිරීමට සුදුසු දේශගුණ කලාප පැවතීම.
* බහුලව තෘණ සපයා ගත හැකි වීම.
* බෝග අවශේෂ සතුන්ට දීමට හැකි වීම.
* කර්මාන්තවල අතුරුඵල සත්ත්ව ආහාර ලෙස ගැනීමට හැකි වීම. (මොලැසස් , පුනක්කු, හාල් නිවුඩු)
* සත්ත්ව පාලනය සඳහා ශ්‍රමිකයින් සිටීම. **(ලකුණු 02)**

(ii) a) ප්‍රිෂියන්, අයර්ෂයර්, ජර්සි, සහිවාල් , රතු සින්දි **(ලකුණු 02)**
b) කාබෝහයිඩ්‍රේට - බඩඉරිඟු, සහල් නිවුඩු, සුනු සහල්
ප්‍රෝටීන ආහාර - මාළු කුඩු, කිරිපිටි, පොල් හා තල පුනක්කු **(ලකුණු 02)**

(iii) a) පිරිමි ගවයෙකු යොදා ගැනීම. කෘතිම සිංචනය **(ලකුණු 02)**
b) * ආහාර ගැනීම අඩු වීම. * නිතර නිතර කඳ කැඩීම.
* යෝනිය ඉදිමී රතු පැහැ වීම. * වරින් වර කොන්ද නමා මුත්‍රා කිරීම.
* දෙනගේ නොසන්සුන් බව * වෙනත් සතුන්ට පිට මත නැගීමට ඉඩදීම.

**(ලකුණු 02)**

06. (i) ක්ෂුද්‍ර ජීවීන් , ජලය , ආලෝකය, වාතය ඇතුළුවීම වැළැක්වීම. **(ලකුණු 02)**

(ii) a) කිරි , පලතුරු යුෂ
b) සොසේජස් , මීට් බෝල්ස් , රට ඉඳි **(ලකුණු 04)**

(iii) a) වාතය, ජලය ඇතුළුවීමට හැකියාව, ආහාරයේ තෙල් වර්ග උරා ගැනීම. **(ලකුණු 02)**
b) $CO_2$ - බැක්ටීරියා , දිලීර මර්දනයට
$N_2$ - ක්ෂුද්‍ර ජීවීන් පාලනයට **(ලකුණු 02)**

07. (i) a) * ක්ෂුද්‍ර ජීවීන් අක්‍රිය කිරීම * එන්සයිම ක්‍රියා අක්‍රිය කිරීම.
* මහා ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය වැළැක්වීම. **(ලකුණු 03)**

b) වියළීමෙන් ආහාරවල ජලය අඩු වේ. එවිට ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය හා එන්සයිමීය ක්‍රියාකාරීත්වය නවතී. **(ලකුණු 01)**

(ii) a) සිට්‍රික් අම්ලය - ආවේණික රසය ලබා දීම.
b) සීනි - රසය වැඩි කිරීම හා සාන්ද්‍රීකරණ මාධ්‍ය ලෙසට
c) පෙක්ටීන් - උකු බව ලබා ගැනීමට
d) සෝඩියම් මෙටා බයිසල්ෆයිඩ් - ආහාර කල් තබා ගැනීමට **(ලකුණු 04)**

(iii) a) ආහාරවල ජලය ඉවත් වීම, දුම්වල ඇති රසායන ද්‍රව්‍ය ආහාර වටා ආරක්ෂිත වළල්ලක් වීම. **(ලකුණු 01)**
b) * බිලාන්වීකරණය
* දෙහි යුෂ මිශ්‍ර කිරීම. **(ලකුණු 01)**